D138



# සිදත්සඟරා කර්තෘගේ භාෂා සැලසුම්කරණය පිළිබඳ අධ්‍යයනයක්

දර්ශන විශාරද (Ph.D) උපාධිය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයන අංශයට ඉදිරිපත් කෙරන පර්යේෂණාත්මක නිබන්ධය යි.

UCLIB
583479

එස්. ඩී. අනුරින් ඉන්දිකා
(Reg. No. 2011/Ph.D/78)
සිංහල අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය
ශ්‍රී ලංකාව

University of Colombo Sri Lanka Library

2015

## හැඳින්වීම

මානව සමාජයේ සමාජ ස්වරූපය, සමාජීය ක්‍රියාවලිය, සමාජ කණ්ඩායම්වල විවිධ විෂයයන් අධ්‍යයනයට හසු කළහැකි වන්නේ භාෂාව ප්‍රධාන මූලාශ්‍රය හා මාධ්‍ය ඒකකය ලෙස ද පිළිගැනීමෙනි. යම්කිසි මානව සමාජ සංස්ථිතියක් විශ්ලේෂණයේ දී ඓතිහාසික සමාජ තොරතුරු විවරණයෙන් අපේක්ෂිත කාර්යය සම්පූර්ණ කරගත හැකිය. ඊට මුල් වන්නේ ඒ සමාජ භාවිතයේ පැවැති භාෂාව යි. භාෂාව සැබෑ සමාජ නිරූපණයක් ලෙස ගෙන ඒ භාෂක සමාජය පිළිබඳ ව පුළුල් අධ්‍යයනයකට ඒ භාෂක සමාජයේ සමාජ, සංස්කෘතික, දේශපාලන මෙන් ම ආර්ථික පසුබිම හා තත්ත්වය සමාජ විෂයක භාෂා අධ්‍යයනයක දී වැදගත් වෙයි.

මේ අධ්‍යයනයට පාදක මූලාශ්‍රය වන, දහ තුන්වන සියවසේ දී එනම් දඹදෙණි රාජධානි සමයේ (ක්‍රි. ව. 1232-1293) සම්පාදනය වූ **සිදත්සඟරාව** පිළිබඳ අධ්‍යයනයට අවශ්‍ය පරිසරය එකල සමාජ ස්වරූපය අධ්‍යයනයෙන් හෙළිකොට ගත හැකිය. ඊට උපයුක්ත ප්‍රධාන මූලාශ්‍රමය මාධ්‍ය වන්නේ ද කාලීන භාෂාව යි. වර්තමානයේ දී භාෂාව සමාජ සංසිද්ධියක් වශයෙන් සලකා සමාජය පිළිබඳ ව අධ්‍යයනය සමාජ විෂයයීක වාග්විද්‍යාවේ ප්‍රධාන එක් අභිලාෂයකි. **සිදත්සඟරාව** වැනි සම්භාව්‍ය ව්‍යාකරණ ග්‍රන්ථයක් බිහිවීමට හේතු වූ සමාජයත්, ග්‍රන්ථය නිර්මාණයටත් එහි භාෂා සැලසුම්කරණ විග්‍රහයටත් ප්‍රධාන වශයෙන් ම පාදක වන්නේ භාෂාව යි. ඊට න්‍යායාත්මක පසුබිම සැකැසෙන්නේ සමාජ විෂයක භාෂා අධ්‍යයනයක් සිදු කෙරෙන සමාජවාග්විද්‍යාවෙන් ය.

සිංහල භාෂාවේ පරිණාමය මුල්කරගෙන විද්වතුන් විසින් බෙදනු ලැබ ඇති යුග අතුරෙන් මධ්‍යතන යුගයට අයත් **සිදත්සඟරාවේ** ග්‍රන්ථ කර්තෘත්වය හා එහි අන්තර්ගත කරුණු සම්බන්ධයෙන් විවිධ මතවාද පැන නැගී තිබුණ ද මූලාශ්‍රමය කෘතියේ සඳහන් ආකාරයට මේ කෘතිය රචනා කොට ඇත්තේ පතිරජ පිරුවන යි. මෙහි අන්තර්ගත ව්‍යාකරණාංග ගද්‍ය, පද්‍ය විෂය දෙකට ම භාවිත කළ හැකියි. පරිච්ඡේද දොළොහක් ඇතුළු කොට ව්‍යාකරණ විධි විස්සක් හෙළිකොට ඇති මේ කෘතියේ මුල් පරිච්ඡේද දහය වෙන් කොට ඇත්තේ සිංහල භාෂාවේ ව්‍යාකරණ විභාගයට යි. අවසන් පරිච්ඡේද දෙක කාව්‍ය භාෂාව පාදක කොටගෙන ම රචිත යි. සමාජවාග්විද්‍යාවේ උපවිෂයයීක ප්‍රදේශයක් වන භාෂා සැලසුම්කරණයේ තවත් අනුප්‍රභේදයක් වන භාෂා සංහිතා සැලසුමට අනුව විවිධ පුද්ගලයන් භාෂාවේ සංවර්ධනය උදෙසා සිදුකරන ලද කාර්යභාරය ද වැදගත් වෙයි. සිංහල භාෂාව සම්බන්ධයෙන් සැලකීමේ දී පතිරජ පිරුවන්පති හිමියන්ගෙන් සිදුව ඇති මෙහෙය විශේෂ ය.

### පර්යේෂණ පසුබිම හා අධ්‍යයනයේ වැදගත්කම

මාඝගේ දේශපාලන ක්‍රියාවලිය හමුවේ සමාජ විෂයයීකව සියලු කාරණා පරිහාණියට පත්ව ඇති අතර (ක්‍රි. ව. 1215-1236) නව යුගයක් උදා වී ඇත්තේ iii වන විජයබාහු රජු හා (ක්‍රි. ව. 1232-1236) ඔහුගේ පුත් ii වන පරාක්‍රමබාහු රජු (ක්‍රි. ව. 1236-1270) දඹදෙණිය රාජධානිය කරගෙන පාලනය ගෙන ගිය කාලයේ දී ය (**පූජාවලිය**, 1961: 33-34

පරි., පරණවිතාන, 1972; 581- 601). පූර්ව සමාජ පසුබිම උපයුක්තව **සිදත්සඟරාව** අධ්‍යයනයේ දී සමාජ පරිහාණි තත්ත්වයකින් පසුව බිහි වූ නව යුගයේ පැවැති භාෂා පරිහාණියත්, ව්‍යාකරණ ග්‍රන්ථ නොවීමත්, ප්‍රාමාණික භාෂා ඥානයෙන් යුතු වියතුන්ගේ ඌනතාවත් පාදකව සිංහල භෂාවේ ව්‍යාකරණ සංස්ථිතිය උපයුක්තව රීති මාලාවක් ගොඩනැඟීම අවශ්‍ය වී ඇත.

මාඝ පාලන ක්‍රියාදාමය නිසා (ක්‍රි. ව. 1215-1236) පරිහාණියට පත්ව තිබූ සිංහල භාෂාව ආරක්ෂා කර ගැනීමේ ප්‍රබල ව්‍යායාමයක් පැවැති බව **සිදත්සඟරාව** සම්පාදනය වීමට බලපෑ සමාජය අධ්‍යයනයෙන් පෙනී යයි. ඒ අතර පසුකාලීන පෘතුගීසි, ලන්දේසි සමයන්හි මෙන් ම ඉංග්‍රීසි පාලන කාලයේ දී ද සිංහල භාෂාව ආරක්ෂා කර ගැනීමේ මාර්ගෝපදේශ කෘතිය, 'අත්පොත', 'ගුරු පොත' ලෙස භාවිතයට ගෙන ඇත්තේ ද **සිදත්සඟරාව** යි. **සිදත්සඟරාව** පාදකව බිහිව ඇති විවිධ හා නව ව්‍යාකරණ ග්‍රන්ථ බිහිවීමට මුල් වූ සමාජ පසුබිම අධ්‍යයනයෙන් ද මේ බව පැහැදිලි වෙයි.

ඩබ්ලිව්. එෆ්. ගුණවර්ධනයන්ගේ (1924) **සිද්ධාන්ත පරීක්ෂණය** බිහි වීමෙන් පසුව **සිදත්සඟරාව** සිංහල භාෂාවේ ව්‍යාකරණ රීති ඉගැන්වීමට ප්‍රමාණවත් නොවන කෘතියක් මෙන් ම එහි විවිධ ඌනතා පවතින බවත්, පද්‍යකරණයේ ව්‍යාකරණ රීති සඳහා බිහිව ඇති ව්‍යාකරණ කෘතියක් බවත් දක්වමින් මේ වන තෙක් බිහිව ඇති ග්‍රන්ථ, ශාස්ත්‍රීය ලිපි ලේඛන බහුල ය. ඒ අතර **සිදත්සඟරා** දක්වීම් සම්මතකරණය කොට තිබුණ ද ඉස්මතුව පෙනෙන්නේ **සිදත්සඟරාවේ** ඌනතා ය. **සිදත්සඟරාව** පිළිබඳ ව රචනා වී ඇති කෘති, විචාර, විමර්ශන බහුල වුවත් වර්තමානය වන විට විවිධ ව්‍යාකරණ ග්‍රන්ථ රචනා වී පැවතුණත් සිංහල භාෂාවේ අනන්‍යතාව ආරක්ෂා කරන මෙන් ම සිංහල භාෂාවේ ව්‍යාකරණ ව්‍යුහය සාධකව සම්භාව්‍ය ව්‍යාකරණ කෘතිය බවට පත්ව ඇත්තේ **සිදත්සඟරාව** යි. නමුත් **සිදත්සඟරාව** පාදකව ගොඩනැගී ඇති භාෂා සැලසුම්කරණ ප්‍රයත්න පිළිබඳ ව මෙතෙක් කිසිදු වාග්විද්‍යාත්මක අධ්‍යයනයක් සිදුව ඇති බවක් නොපෙනේ.

**සිදත්සඟරාව** සැකැසීමෙන් පසුව වර්තමාන අවදිය දක්වාම **සිදත්සඟරාව** භාවිත කොට සිංහල භාෂාව උපයුක්තව සිදුව ඇති ප්‍රතිසංස්කරණ, සංවර්ධනයන් හා නවීකරණයන් වුවත් ඒ පිළිබඳ ව මෙතෙක් විද්වත් අවධානය යොමු වූ බවක් නොපෙනේ. **සිදත්සඟරාව** පාදකව සිදුව ඇති සැලසුම්කරණයන් රාජ්‍ය මට්ටමින් මෙන් ම පෞද්ගලිකව ද සිදුව තිබේ (De Alwis, 1851., ධර්මාරාම, 1902,. ගුණවර්ධන, 1959). රජයේ මැදිහත් වීමෙන් මෙන් ම පෞද්ගලිකව ව්‍යාකරණ කෘති සම්පාදනය වීම සිංහල භාෂාවේ ව්‍යාකරණය ඉගෙන ගැනීමට හා ඉගැන්වීමට දීර්ඝ කාලීනව **සිදත්සඟරාව** සම්මතයේ තිබීම කැපී පෙනෙයි.

ජෝන් හනී නමැති වාග්වේදියා *'Language is Power'* නම් කෘතියෙන් භාෂාවක බලය, ප්‍රභුත්වය සමඟ ගොඩනැගෙන අධිකාරිත්වයට කරුණු තුනක් හේතුවන බව පෙන්වා දී තිබේ. ඒ සම්මතකරණය, සංහිතාකරණය, හා නිර්දේශීකරණය යි (Honey, 1997: 110).

**සිදත්සඟරාව** සාධකව පූර්ව කරුණු තුනම අදාළ වේ. මෙය ඉස්මතු වී පෙනෙන්නේ සමාජ පරිහාණි සමයකින් පසුව නැවත පුනර්ජීවය ලබන සමාජයකිනි. මේ බව ද සිල්වා ද සනාථ කොට තිබේ (1967, 1976).

**සිදත්සඟරාව** කෙරෙහි අවධානය යොමු කිරීමේ දී **සිදත්සඟරාව** බිහි වීමටත්, විවිධ කාලවල දී **සිදත්සඟරාවේ** වටිනාකම ඉස්මතු වෙමින් සමාජ ගරුත්වයට පාත්‍ර වීමට බලපෑ සමාජ කරුණුත්, **සිදත්සඟරාව** දීර්ඝ කාලීනව සිංහල භාෂාවේ සම්භාව්‍ය ව්‍යාකරණ ග්‍රන්ථය මෙන් ම ව්‍යාකරණ රීති ඉගැන්වීමේ 'අත්පොත' ලෙස සම්මතකරණයට හසුවීමට බලපෑ සමාජ කරුණු මෙහි දී සමාජවාග්විද්‍යාත්මක දෘෂ්ටි කෝණයකින් විග්‍රහයට හසු කෙරෙයි. තව ද **සිදත්සඟරාව** සාධකව සිංහල භාෂාවේ ව්‍යාකරණ පද්ධතියේ සිදු වූ සම්මතකරණයන්, ප්‍රතිසංස්කරණයන්, සංවර්ධනයන් සමාජවාග්විද්‍යාවේ අනුප්‍රභේදයක් වූ 'සංහිතා සැලසුම්කරණය' ඇසුරෙන් විග්‍රහයට හසු වෙයි. එහි දී සිංහල භාෂාවේ ව්‍යාකරණ ව්‍යූහයේ අභ්‍යන්තර සංස්ථිතිය අධ්‍යයනයට හසු කරමින් **සිදත්සඟරාව** පාදකව පතිරජ පිරුවන්පති හිමියන් සිංහල භාෂාව උපයුක්තව ගොඩනැගූ භාෂා සැලසුම්කරණයේ ස්වභාවය හෙළිදරව් කෙරෙයි.

## අධ්‍යයන ක්‍රමවේදය

මේ අධ්‍යයනය සඳහා යොදා ගැණුනේ **සිදත්සඟරාවේ** මුල් පරිච්ඡේද දහයයි. **සිදත්සඟරාවට** සැකසී ඇති විවිධ සන්න, විවාර, විමර්ශන ග්‍රන්ථ මෙන් ම විවිධ ශාස්ත්‍රීය හා පර්යේෂණ ලිපි ලේඛන ද, පරිවාර ව්‍යාකරණ ග්‍රන්ථ මෙන් ම නූතන ව්‍යාකරණ ග්‍රන්ථ ද ඇසුරින් දත්ත එක්රැස් කරගන්නා ලදි. කාලීන සමාජ ස්වරූපය හා භාෂා තත්ත්වය ද හඳුනාගත යුතු වූ නිසා **ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය, ලංකාවේ අධ්‍යාපන** (සියවස ප්‍රකාශනය 1, 2, 3), **සිංහල සාහිත්‍ය වංශය, සිංහල භාෂා ඉතිහාසය, දඹදෙණි යුගය, සිංහල භාෂාධ්‍යයන ඉතිහාසය** ඇතුළු ව අදාළ ග්‍රන්ථ පරිශීලනයෙන් සමාජ හා භාෂා ස්වරූපය හඳුනා ගැනීමට අවශ්‍ය දත්ත ද ලබාගත් අතර මේ කෘති ආශ්‍රයෙන් කාලීන සමාජ ස්වරූපය සිංහල භාෂාව හා ව්‍යාකරණය විශේෂ හා පොදු ලක්ෂණ වෙන් කොට හඳුනා ගත්තෙමි. දත්ත විශ්ලේෂණයේ දී නූතන වාග්විද්‍යාවේ භාෂා සැලසුම්කරණයට අයත් මූලධර්ම යොදාගැණුනි. **සිදත්සඟරාව** ප්‍රස්තුතව සිංහල භාෂාවේ අභ්‍යන්තර රීති ව්‍යූහය පිළිබඳ ව අධ්‍යයනයේ දී වැදගත් වන්නේ සමාජවාග්විද්‍යාවේ සංහිතා සැලසුම්කරණය යි. සිංහල භාෂාවේ අභ්‍යන්තර සංස්ථිතිය විග්‍රහය මෙමගින් සිදු වෙයි.

භාෂාවක අභ්‍යන්තරයේ සිදු කරන සැලසුම්කරණයේ ප්‍රභේද දෙකක් හඳුනාගත හැකිය. යම් භාෂාවක තත්ත්වයක් සැලසුම් කිරීමේ අරමුණින් බහුවාර්ගික සමාජයක භාෂා ගණනාවක් අතුරෙන් කුමන භාෂාව රාජ්‍ය භාෂාවක තත්ත්වයට පත්කරන්නේ ද යන්න තීරණය කරන ක්‍රියාවලිය එක් සැලසුම්කරණයකි. මෙය භාෂා තත්ත්ව සැලසුම්කරණය යි (Status Language Planning). ඒ අතර කාලීන වශයෙන් අවශ්‍යාකාරයට භාෂාවේ අභ්‍යන්තර ව්‍යූහය සැලසුම්කරණය කිරීම සංහිතා (ස්වරූප) සැලසුම්කරණය යි (Corpus Planning). ඒ

අනුව **සිදත්සඟරා** කතුවරයා හෙළිදරව් කළ සිංහල භාෂාවේ අභ්‍යන්තර ව්‍යාකරණ විධි ව්‍යූහය සාධක සැලසුම්කරණයේ ස්වරූපය දැක්වීම සඳහා ආධාර කොටගෙන ඇත්තේ සංහිතා සැලසුම්කරණය යි. එහි අනුවිෂයයීකාංග කිහිපයක් යටතේ **සිදත්සඟරාව** අධ්‍යයනයට හසු කොට ඇත. පාරිශුද්ධීකරණය (Purification) පුනරුත්ථාපනය (Revival) ප්‍රතිසංස්කරණය (Reform) සම්මතකරණය (Standardization) ව්‍යාප්තීකරණය (Spread) නවීකරණය (Mordernization) ශබ්දමාලාව සැලසුම්කරණය (Terminology Unification) ප්‍රයෝග සරලීකරණය (Stylistic Simplification) විෂයය යි (Nahir, 2003: 423-443., Eastman, 1983: 2003, 1-14).

**සිදත්සඟරාව** බිහි වූ අවදිය පාලි, සංස්කෘත හා දෙමළ භාෂාව ද පසු අවධිවල දී ඉංග්‍රීසි භාෂාව ප්‍රමුඛව පෘතුගීසි, ලන්දේසි භාෂා බලපෑමෙන් හා සිංහල භාෂාවේ පරිහාණිත්වය මත අපරිශුද්ධකරණයට හසු වීමෙන් වළකාගෙන ආරක්ෂා කර ගැනීමේත්, භාවිතයට ගැනීමේත් අවශ්‍යතාව පදනම්ව සිංහල භාෂාව **සිදත්සඟරාව** සාධකව පාරිශුද්ධීකරණයට හසු වූ අයුරු බාහිර සහ අභ්‍යන්තර යන අංශ දෙක පදනම් කොටගෙන සාකච්ඡා කොට තිබේ. තව ද දහඅට, දහනවය, විසිවන සියවස්වල දී සිංහල භාෂාවේ පරිහාණියෙන් පසු පුනරුත්ථාපනය වූ අයුරුත් කාලීන අවශ්‍යතාවන්ට අනුකූලව සැකැසුණු ආකාරයත් පුළුල් විග්‍රහයකට හසුකොට ඇත්තේ සන්න, ව්‍යාඛ්‍යාන, විස්තර විමර්ශන ග්‍රන්ථ මෙන් ම විවිධ ව්‍යාකරණ කෘති හා නව ව්‍යාකරණ ග්‍රන්ථ ද ඇසුරු කොටගෙනයි. එහි දී සිංහල භාෂාවේ පරිශුද්ධතාව, ප්‍රභූත්වය, අධිකාරිත්වය රැකීමට **සිදත්සඟරාව** හේතු වී ඇති ආකාරය දඹදෙණි යුගයට පමණක් සීමා නොවී වර්තමාන අවදිය තෙක්ම බලපා ඇති අයුරු පුළුල් විග්‍රහයකට හසුකොට තිබේ. එසේ ම **සිදත්සඟරාව** මුල්ව හා **සිදත්සඟරාව** පාදකව බිහිව ඇති සන්න, ව්‍යාඛ්‍යාන, විස්තර, විමර්ශන කෘති ඇසුරෙන් **සිදත්සඟරා** ව්‍යාකරණ ප්‍රයෝග සම්මතකරණය වී ඇති අයුරු විභාග විය. භාෂාවක සම්මතකරණය පිළිබඳ කරුණු දක්වන වාග්වේදීන්ගේ අදහස වන්නේත් භාෂාවක ලේඛන ව්‍යවහාරයක් මඟින් සම්මතකරණයත්, ප්‍රවර්ධනයත් ක්‍රියාත්මක වන බව යි (Milroy & Milroy, 1999: 27).

මේ හා බද්ධ සංහිතා සැලසුම්කරණයේ වැදගත් ප්‍රභේදයක් වන්නේ නිර්දේශීකරණය යි. වාග්වේදීන් විසින් පෙන්වා දෙන ලද භාෂාත්මක නිර්දේශ යම් භාෂාවක නිරවද්‍ය, සාවද්‍ය වශයෙන් දැක්වීම ජීවමාන ඕනෑම භාෂාවක හඳුනාගත හැකි පොදු ලක්ෂණයක් බවත් එය නිර්දේශීකරණයේ ස්වරූපය ලෙසත් වාග්විද්‍යාඥයින්ගේ අවධානයට හසුව ඇත (Milroy and Milroy, 1999). උගත්, සම්භාව්‍ය පංතියේ නිර්දේශය මත **සිදත්සඟරාව** ශිෂ්ට, සම්භාව්‍ය මෙන් ම නිවැරදි ව්‍යාකරණ අන්තර්ගත කෘතිය යන්න භාෂාත්මක සමාජය තුළ පැතිර ගිය බවක් පෙනී යයි. එහි ප්‍රතිඵලය විවිධ ප්‍රභේද කරා පැතිර ගොස් ඇත. **සිදත්සඟරා** රීති සම්මතකරණයත්, **සිදත්සඟරා** කතුවරයා විසින් පෙන්වා දෙන ලද ඡේක ව්‍යවහාරය හා කාලීන අවශ්‍යතා මත විවිධ ව්‍යාකරණ රීති සැකැසීමේ නිර්දේශයත් සම්මතකරණය වී තිබීම ඒ අතර කැපී පෙනෙයි. අධ්‍යයන කෘතියක් ලෙස **සිදත්සඟරාව** පිළිගැනීමට ද මේ

නිර්දේශීකරණය හා සම්මතකරණය හේතු වී තිබේ. ඊට දේශපාලනික මෙන් ම සමාජ, සංස්කෘතික පරිසරවල බලපෑමේ ස්වරූපය ද මෙහි දී සාකච්ඡාවට හසු විය. ඒ අතර කාලීන අවශ්‍යතා සඳහා **සිදත්සඟරා** ව්‍යාකරණ ප්‍රයෝග ප්‍රතිසංස්කරණය හා නවීකරණයට හසුව ඇති අයුරු විශේෂයෙන් ම **සිදත්සඟරාව** බිහි වූ සමාජයේ **සිදත්සඟරාවෙන්** සිදුවූ අයුරු පසුකාලීන ව විවිධ හා නව ව්‍යාකරණ ග්‍රන්ථ ආශ්‍රයෙන් සිදුව ඇති අයුරුත් විභාග විය. භාෂා ශෛලියේ මෙන් ම වාග්කෝෂයේ සිදුවන මෙවැනි වර්ධනාත්මක අංශ භාෂා නවීකරණ ක්‍රියාවලියක වැදගත් අංගයන්ය (Ferguson, 1968). භාෂා සංහිතා සැලසුම්කරණයේ අංගයක් වශයෙන් සිදුව ඇති අක්ෂර මාලාවේ සංශෝධනය, පාරිභාෂික පද සාධනය සම්මත ලේඛන ස්වරූපය සකස්කර ගැනීම සඳහා ව්‍යාකරණ සිද්ධාන්ත **සිදත්සඟරාව** විෂයයීකව ගොඩනැගුණ නව සිද්ධාන්ත කාලානුරූපව භාෂා සංස්ථිතිය සැකසුණ අයුරු ද මේ අධ්‍යයනයේ දී අවධානයට යොමු වූ තවත් පැතිකඩකි.

බාහිර සමාජ කරුණු ද සාධකව සිංහල භාෂාවේ අභ්‍යන්තර ව්‍යාකරණ රීති පද්ධතියේ කාලීන අවශ්‍යතා සඳහා අක්ෂර මාලාවක් සකසා ගැනීම, රීති පාරිශුද්ධීකරණය, **සිදත්සඟරා** ව්‍යාකරණ ප්‍රයෝග සම්මතකරණය, නව ශෛලීන් ගොඩනගා ගැනීම, ඒ ඇසුරින් භාෂාවේ රීති සමූහයේ සිදුව ඇති විවිධ ප්‍රතිසංස්කරණ, සංවර්ධනයන් හා නවීකරණයන් හා ඒවායේ නිර්දේශීකරණයන් **සිදත්සඟරාව** ආශ්‍රිත ව්‍යාකරණ කෘති මෙන් ම නව ව්‍යාකරණ කෘති සම්පාදනය වීම සාධකව අධ්‍යයන ක්ෂේත්‍රයේ සංවර්ධනයට ලැබෙන දායකත්වය වැනි කරුණු සම්බන්ධයෙන් මෙන් ම සිංහල භාෂාවේ ව්‍යාකරණ රීති පද්ධතිය එක්තැන් කිරීමත් සමග **සිදත්සඟරාවෙන්** ලැබෙන භාෂාමය දායකත්වය, එය ලේඛන ව්‍යවහාරය සැලසුම් කිරීමට බලපා ඇති ආකාරය වැනි කරුණු විශේෂයෙන් මෙහි දී අවධානයට හසුව ඇත.

## අධ්‍යයන ක්ෂේත්‍රය හා සාහිත්‍ය ග්‍රන්ථ විමර්ශනය

**සිදත්සඟරාව** අරමුණු කොටගෙන විවිධ ග්‍රන්ථ, ශාස්ත්‍රීය ලිපි ලේඛන ආදිය බහුලව රචනා වී තිබුණ ද ඒ ලේඛනවල විශේෂයෙන් ම ඇතුළත් වන්නේ ග්‍රන්ථ කතුවරයා විසින් දක්වන ලද සිංහල භාෂාවේ ව්‍යාකරණ, ඒ හා බැඳුණු විවිධ රීති, ඒවා විග්‍රහකොට ඉදිරිපත් කිරීමේ දී දක්වා ඇති ඌනතා මෙන් ම ඒ ඌනත්වය සම්පූර්ණ කිරීමට ඉදිරිපත් කරන ලද විෂයානු බද්ධ කරුණු යි. සිංහල භාෂාවේ ව්‍යාකරණ ප්‍රයෝගවල අභිවෘද්ධිය වෙනුවෙන් සිද්ධාන්ත එක්තැන් කොට තැබීම, පාරිශුද්ධීකරණය, සම්මතකරණය පමණකුදු නොව ප්‍රතිසංස්කරණය, සංවර්ධනය හා නවීකරණය වෙනුවෙන් ක්‍රියාත්මක වී ඇති සැලසුම්කරණ විවිධ කාල හා බද්ධ වන අතර සංකීර්ණ ස්වරූපයක් ද උසුල යි. විශේෂයෙන් ම සම්මත අක්ෂර මාලාවක් කාලීන අවශ්‍යතා වෙනුවෙන් භාවිතයට ගැනීම ඡේක ප්‍රයෝගවල ඇති වැදගත්කම මෙන් ම කාලීන බව, සිංහල භාෂාවේ ව්‍යාකරණ සංස්ථිතිය හඳුන්වා දීම, කාලීන අවශ්‍යතා සඳහා භාෂා රීති ප්‍රතිසංස්කරණය, සංවර්ධනය හා නවීකරණය කිරීම වැදගත් ය.

**සිදත්සඟරා කර්තෘගේ භාෂා සැලසුම්කරණය** යන මාතෘකාවට අනුගතව සිදු කෙරුණු මේ අධ්‍යයනයේ දී ප්‍රාථමික හා ද්විතීයික යන දෙවැදෑරුම් වූ මූලාශ්‍ර හා

Library

විමර්ශනාත්මක ග්‍රන්ථ භාවිත කොට තිබේ. අධ්‍යයනය සඳහා පාදක වූ ආකාරය ද යොදාගෙන එහි විධිමත්භාවය වෙනුවෙන් කොටස් කිහිපයක් යටතේ ඒ පිළිබඳ ව කරුණු ඉදිරිපත් කෙරෙයි. ඒ දඹදෙණි යුගය හා එහි භාෂා තත්ත්වය පාදකව රචිත ග්‍රන්ථ හා සම්මේලන සටහන් හා ලිපි ලේඛනාදිය, **සිදත්සඟරාව** යොදාගෙන රචනා වී ඇති සන්න, ව්‍යාඛ්‍යාන, විචාර විමර්ශනාදිය, **සිදත්සඟරාව** පාදකව බිහිව ඇති ව්‍යාකරණ කෘති හා නව ව්‍යාකරණ ග්‍රන්ථ මෙන් ම **සිදත්සඟරාව** සාධකව රචනා වී ඇති වාග්විද්‍යාත්මක ග්‍රන්ථ, ශාස්ත්‍රීය ලිපි ලේඛන හා මේ අධ්‍යයන ක්‍රමවේදයේ (න්‍යායාත්මක පසුබිම) සිද්ධාන්ත හෙළිදරව් කොටගත් විවිධ සිංහල හා ඉංග්‍රීසි වාග්විද්‍යාත්මක ග්‍රන්ථ හා ලිපි ලේඛනයි.

**සිදත්සඟරාව** බිහිවීමට බලපෑ දඹදෙණි යුගයේ සමාජ, සංස්කෘතික, දේශපාලන හා අර්ථ තත්ත්වය විමර්ශනයේ දී **ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය** (1972), (සංස්.) **ලංකාවේ අධ්‍යාපන** (සියවස ප්‍රකාශන) 1, 2, 3 (1969), සන්නස්ගල (1994) **සිංහල සාහිත්‍ය වංශය**, ඤාණානන්ද හිමි (1963) **සිංහල භාෂා ඉතිහාසය**, සුමනජෝති හිමි (2503) **දඹදෙණි යුගය**, ධම්මරතන හිමි (1963) **සිංහලයේ ද්‍රවිඩ බලපෑම**, බලගල්ලේ (1988) **සිංහල භාෂාධ්‍යයන ඉතිහාසය** යන කෘති වැදගත් වූ අතර **දඹදෙණි කතිකාවත**, **පූජාවලිය**, **සද්ධර්මරත්නාවලිය**, **කව්සිළුමිණ** හා මේ කාලයේ රචනා වී ඇති විවිධ සන්න ග්‍රන්ථ හා සාහිත්‍ය කෘති ආශ්‍රය කෙරුණු අතර එමගින් **සිදත්සඟරාව** සම්පාදිත එවක පැවැති භාෂා තත්ත්වයේ ස්වරූපය හෙළිදරව් කිරීමට උත්සාහ දැරිය.

මේ අධ්‍යයනයේ දී ප්‍රධාන මූලාශ්‍ර බවට තෝරා ගත්තේ **සිදත්සඟරාව** යි. **සිදත්සඟරාව** වෙනුවෙන් සංස්කරණ රාශියක් සැකැසී තිබුණ ද විධිමත් සංස්කරණයක් වශයෙන් විද්වතුන් විසින් පිළිගනු ලැබ ඇති රත්මලානේ ධර්මාරාම හිමියන්ගේ **සිදත්සඟරා විස්තර සන්නය** පෙළපොත වශයෙන් භාවිතයට ගැණිත. අනෙකුත් සංස්කරණ භාවිත වන්නේ උපකාරක ප්‍රාථමික මූලාශ්‍ර ලෙස යි. **සිදත්සඟරා සන්න ග්‍රන්ථ**, **සිදත්සඟරා සන්න සහිත විචාර ග්‍රන්ථ**, **සිදත්සඟරා විචාර ග්‍රන්ථ**, **සිදත්සඟරා පුරාණ සන්න ග්‍රන්ථ** හා **සිදත්සඟරා ලියන සන්න ග්‍රන්ථ** ලෙස වර්ගීකරණයක් ද යොදාගෙන මේ ග්‍රන්ථ භාවිත වුවත් අධ්‍යයනයේ අවශ්‍යතාව මත විවිධ අවස්ථාවල දී ඒ ග්‍රන්ථ ඇසුර ලබාගෙන තිබේ. ඤානාලෝක හිමි (1971) (සංස්) **සිදත්සඟරා පුරාණ සන්නය**, පුරාණ සන්නය සඳහා යොදාගෙන ඇති අතර ඒ. එම්. ජී. (වර්ෂය නැත) (සංස්) **සිදත්සඟරා මහා සන්නය** හා **ලියන සන්නය** ද පෙරේරා (1876) (සංස්) **සිදත්සඟරා ලියන සන්නය** ද පුරාණ, මහා හා ලියන සන්නය සඳහා යොදාගත් සංස්කරණ ය.

සන්න ග්‍රන්ථ අතර පෙරේරා (1865) **සිදත්සඟරා**, සංස්කාරක නම සඳහන් නැති (1877) (සංස්) **සිදත්සඟරා** ඒ. එම්. ජී. (වර්ෂය නැත) **සිදත්සඟරාව ග්‍රන්ථාර්ණවය**, සුමඞ්ගල හිමි (1884) **සිංහල ව්‍යාකරණය සිදත්සඟරා සන්නය**, ගුණරත්න (වර්ෂය නැත) **සිදත්සඟරා සරල සන්නය**, ගුණවර්ධන (1959) **සිද්ධාන්ත පරීක්ෂණය**, ප්‍රඥාසේන (1924) **සිදත්සඟරා විනිස**, සුමඞ්ගල රතනසාර (1929) **සිදත්සඟරා භාව සන්නය**, කුමාරණතුංග, මුනිදාස (1935)

පූර්වාර්ධය, ගුණවඩු (1964) අපරාර්ධය **සිදත්සඟරා විවරණය**, සිද්ධාර්ථ හිමි (1955) **සරල සන්න සහිත සිදත්සඟරාව**, සිරි සොමිස්සර (1965) **සිදත් සඟරා විමසුම**, තෙන්නකෝන්, (1967) **සිදත්සඟරාව අරුත් වියකන**, ධම්මපරායන තිස්ස, අටබාගේ ආනන්ද සිරි ඥාණිස්සර (1966) **සිදත් සඟරා විචාරය සහ සරසවි වියරණය**, සුගතවංශ හිමි (1992) **සන්න සහිත සිදත් සඟරාව**, ජයතිලක (1992) **විමර්ශන සහිත සිදත්සඟරාව**, අභයසිංහ (1998) **ව්‍යාඛ්‍යාන සහිත සිදත් සඟරා**, හා පඤ්ඤාසාර හිමි (2004) **සිදත් සඟරා විමසුම** විශේෂ වශයෙන් භාවිත අතර ද අල්විස්ගේ (1851) *Sidath Sañgarāwa, A Grammar of the Sinhalese Language* කෘතිය ද භාවිතයට හසුවිය. **සිදත්සඟරාව** මුල් කොටගෙන බිහිව ඇති සන්න, ව්‍යාඛ්‍යාන, විමර්ශන හා විචාර ග්‍රන්ථවලින් **සිදත්සඟරා** කර්තෘගේ ව්‍යාකරණ ප්‍රයෝග පැහැදිලි කරමින් ඇතැම් දැක්වීම් සම්මතකරණය කොට තිබුණ ද ඇතැම් රීති සඳහා ප්‍රතිසංස්කරණ, සංවර්ධනාත්මක හා නවීකරණය සඳහා අදහස් ඉදිරිපත් කොට ඇත. මේවා **සිදත්සඟරා** කර්තෘගේ භාෂා සැලසුම්කරණයේ ස්වරූපය හෙළිදරව් කොට ගැනීමට වැදගත් වෙයි.

සමාජ අවශ්‍යතා වෙනුවෙන් සිංහල භාෂාවේ ව්‍යාකරණ ප්‍රයෝග ඉගෙනගැනීමට **සිදත්සඟරාවේ** ව්‍යාකරණ රීතිවල වැදගත්කම වඩාත් ඉස්මතු වී ඇත්තේ දහනවය හා විසිවන සියවස්වල දී ය. නමුත් **සිදත්සඟරාවේ** භාෂාව සංකීර්ණ යැයි එවක උගතුන්ට පෙනීගොස් **සිදත්සඟරාව** මූලික කොට ඊට අනුරූපව ඇතැම් විට සමකාලීන ව්‍යවහාරය ද සැලකිල්ලට ගෙන විවිධ ව්‍යාකරණ ග්‍රන්ථ සම්පාදනය කොට ඇත. ඒ අතර පුංචිබණ්ඩාර, වේරගම (1888) **පද නීතිය**, සුමංගල හිමි (1878) **වර්ණ රීතිය හා සිංහල ව්‍යාකරණය**, පෙරේරා (1905) **එළු වියරණ හෙවත් පද විනිස**, ජොහැන්නස් (1912) **සිංහල භාෂාවේ ව්‍යාකරණය**, අමරසේකර (1928) **ව්‍යාකරණ රත්නය**, කරුණාතිලක (1930) **ශබ්දමාලා හෙවත් සිංහල ව්‍යාකරණය**, ද සිල්වා (1934) **ශබ්දානුශාසනය හෙවත් සිංහල භාෂාවේ ව්‍යාකරණ**, පෙරේරා (1932) **සිංහල භාෂාව** වැනි කෘති කැපී පෙනෙයි.

**සිදත්සඟරාව** සිංහල භාෂාවේ ව්‍යාකරණ ඉගැන්වීමට ප්‍රමාණිකත්වයෙන් තොර මෙන් ම විවිධ ඌනතා ඇතැයි ප්‍රබල ප්‍රතිමත ගොඩනගා ඇත්තේ ගුණවර්ධන (1959) කුමාරතුංග (1935) ද සිල්වා (1963) හා දිසානායක (1970, 1995, 1997) අතුරෙන් ගුණවර්ධන හා කුමාරතුංග ය. **සිද්ධාන්ත පරීක්ෂණයෙන්** හා ව්‍යාකරණ **විවරණයෙන්** ද **ක්‍රියා විවරණයෙන්** ද ගොඩනැගූ ඒ මතයට ප්‍රභූ සමාජයෙන් ද යම් සම්මතයක් ගොඩනැගී ඇති අයුරුත් පසුකාලීනව නව ව්‍යාකරණ ග්‍රන්ථ සම්පාදනයට පරිසරය සැකැසුණු අයුරුත් අධ්‍යයනය කිරීමේ දී මේ කෘති වැදගත් විය. ද සිල්වා **සිදත්සඟරාවේ** පළමු පරිච්ඡේදය විග්‍රහාත්මක අධ්‍යයනයකට හසු කරමින් **සිදත්සඟරාව** පද්‍යකරණය සඳහා සැකැසී ඇති ග්‍රන්ථයක් බව පෙන්වා දීමට උත්සාහ දරා ඇත. ජේ. බී. දිසානායකයන් ද **සිදත්සඟරා** ව්‍යාකරණ ප්‍රයෝග විමර්ශනය කොට ඇති අතර නව ව්‍යාකරණ ග්‍රන්ථ ගණනාවක් සිංහල භාෂාව සඳහා සම්පාදනය කොට තිබේ. එහි දී නව දෘෂ්ටියකින් භාෂාව විග්‍රහ කිරීම, කාලීන අක්ෂර මාලාවක් නිර්දේශීකරණයට හසු කිරීමට උත්සාහ දැරීම මුල්කොට ගෙන **සිදත්සඟරා** ව්‍යාකරණ ප්‍රයෝග සම්මතකරණය, ප්‍රතිසංවර්ධනය හා නවීකරණය වැනි විවිධ සැලසුම් ආශ්‍රයෙන් මේ අධ්‍යයනයට වැදගත් විය.

ඒ අතර බසක මහිම පොත් පෙළ, **සමකාලීන සිංහල ලේඛන ව්‍යාකරණය, 1 ව්‍යාකරණ ප්‍රවේශය, සන්ධි විග්‍රහය, නූතන සිංහල ලේඛන ව්‍යාකරණය 1, අක්ෂර වින්‍යාසය** විශේෂ ය. ඩබ්ලියු. එස්. කරුණාතිලකගේ **සිදත්සඟරාව** සාධකව වාග්විද්‍යාත්මක විග්‍රහයන් ද මේ අධ්‍යයනයට යොදාගත් අතර (2006) **භාෂා සමීක්ෂා,** (1995) **සිංහල භාෂා ව්‍යාකරණය** කෘතිය නව ව්‍යාකරණ ග්‍රන්ථ සඳහා යොදාගත් නමුත් එයින් ද වැඩි වශයෙන් **සිදත්සඟරා** ව්‍යාකරණ ප්‍රයෝග සම්මතකරණයට හසුකොට තිබීම **සිදත්සඟරා** කර්තෘගේ භාෂා සැලසුම්කරණ අධ්‍යයනයේ දී හෙළිදරව් විය.

සමාජවාග්විද්‍යාත්මක සිද්ධාන්ත භාවිතය සඳහා සිංහල මෙන් ම ඉංග්‍රීසි කෘති හා ශාස්ත්‍රීය ලිපි ලේඛන ආශ්‍රය විය. ධර්මදාස (1972) **භාෂාව හා සමාජය** (1983) **භාෂා ක්‍රම සම්පාදනය,** කෝපරහේවා (2008) **භාෂා මතවාදාත්මක ලිපි,** (2010) **සිංහල භාෂා විෂයක ජනසම්මතවාද,** (2010) **විසිවන සියවසේ සිංහල භාෂා ව්‍යවහාරය** යන සිංහල කෘති හා ශාස්ත්‍රීය ලේඛන ද Eastman (1983), Ferguson (1968), (1977), Haugen (1966), (1983), Milroy (2000), Milroy and Milroy (1999), Nahir (1984), Rubin, J and Jernudd, (1971) වැනි ඉංග්‍රීසි ග්‍රන්ථ ද ඒ අතර විශේෂ ය. සමාජය විෂයයීක භාෂාධ්‍යයනය සඳහාත් **සිදත්සඟරා** කර්තෘගේ භාෂා සැලසුම්කරණයේ ස්වරූපය දැක්වීම සඳහාත් සමාජවාග්වේදීන්ගේ ග්‍රන්ථ ඇසුරු කරගනු ලැබුවේ ප්‍රධාන වශයෙන් ම සමාජවාග්විද්‍යාත්මක සිද්ධාන්ත හා සංකල්ප පැහැදිලි කිරීමට හා එයින් **සිදත්සඟරා** කර්තෘගේ භාෂා සැලසුම්කරණයේ ස්වභාවය හෙළිදරව් කරගැනීම සඳහා ය.

### අධ්‍යයන සැලැස්ම

**සිදත්සඟරා කර්තෘගේ භාෂා සැලසුම්කරණය** යන මාතෘකාව යටතේ සිදු කෙරුණු මේ අධ්‍යයනයට මූලික අරමුණු දෙකක් ඇතුළත් ය. **සිදත්සඟරා** කර්තෘගෙන් සිදු වූ සැලසුම්කරණය හා **සිදත්සඟරාව** නිසා පසුකාලීව සිදු වූ භාෂා සැලසුම්කරණයයි. සමාජවාග්විද්‍යාත්මක අධ්‍යයනයකට හසුවන මෙය අධ්‍යයනයේ පහසුව හා විධිමත් බව උදෙසා පරිච්ඡේද පහකට වෙන් කෙරිණි.

**සිංහල භාෂාව** විග්‍රහය හා **දඹදෙණි සමාජය** පිළිබඳ කරුණු දැක්වීමට ප්‍රථම පරිච්ඡේදය වෙන් කොට ඇති අතර එහි දී **සිදත්සඟරාව** බිහිවීමට බලපෑ සමාජ පරිසරයත්, එවක පැවැති භාෂා-සාහිත්‍ය ස්වරූපය පිළිබඳවත් සමාජ, සංස්කෘතික හා ආර්ථික පසුබිම යටතේ කරුණු සාකච්ඡා කොට ඇත. **සිදත්සඟරාවː අරමුණු, සංස්ථිතිය හා සිද්ධාන්ත** සහිතව **සිදත්සඟරාව** හැඳින්වීමට දෙවන පරිච්ඡේදය වෙන්කොට තිබේ. එහි දී **සිදත්සඟරා** කර්තෘ **සිදත්සඟරාව** වැනි ව්‍යාකරණ ග්‍රන්ථයක් සැකසීමට හේතුව, ග්‍රන්ථනාමය, කර්තෘ, අරමුණු, න්‍යායාත්මක ක්‍රමවේදය, ග්‍රන්ථාභාෂය, ව්‍යාකරණ ව්‍යූහය පිළිබඳ කරුණු ඉදිරිපත් කොට ඇත්තේ විසිවන හා විසි එක්වන සියවසේ විද්වතුන් විසින් **සිදත්සඟරාව** යොදාගෙන ප්‍රකට කොට ඇති විවිධ මතාකල්ප ද උපයෝගී කොටගෙනයි.

**සිදත්සඟරා** කර්තෘගෙන් සිදු වූ භාෂා සංහිතා සැලසුම්කරණයේ ස්වරූපය හෙළිදරව් කිරීමට තෙවන, සිව්වන හා පස්වන පරිච්ඡේද යොදා ගැනුණි. **සිදත්සඟරාව** විෂයයීකව සිංහල භාෂාවේ අභ්‍යන්තර ව්‍යූහ සැලසුම්කරණය දැක්වීමට '**සිදත්සඟරාවේ ව්‍යාකරණ විධි හා භාෂා සැලසුම් ප්‍රයත්න**' මාතෘකාව යොදා ගැනුණි. එහි දී නවක විද්‍යාර්ථීන් සඳහා ව්‍යාකරණ ග්‍රන්ථයක් සම්පාදනය කිරීම, ඡේක ප්‍රයෝගාශ්‍රය සිංහල භාෂාවේ ව්‍යාකරණ රීති නිර්දේශීකරණය හා සම්මතකරණය කොට ඇති අයුරු ප්‍රධාන වශයෙන් විමර්ශනයට හසුකොට ඇත. '**සිදත්සඟරාවඃ පරිවාර ග්‍රන්ථ හා භාෂා සැලසුම් විධි**' සඳහා සිව්වන පරිච්ඡේදය වෙන් වූ අතර භාෂා සංහිතා සැලසුම්කරණයේ සිද්ධාන්ත යොදාගනිමින් **සිදත්සඟරාව** යොදාගෙන සම්පාදනය කොට ඇති සන්න, පුරාණ සන්න. ලියන සන්න විස්තර හා විචාර ග්‍රන්ථ මෙන් ම **සිදත්සඟරාව** පාදකව සැකැසී ඇති ව්‍යාකරණ කෘතිවලින් සිංහල භාෂාවේ ව්‍යාකරණ ව්‍යූහයේ රීති සැලසුම්කරණයට සම්බන්ධව ඇති අයුරු හා එහි ස්වරූපයත් අධ්‍යයනයට හසුව ඇත. එහි දී **සිදත්සඟරාවේ** ව්‍යාකරණ සඳහා ඡේක ප්‍රයෝග ආශ්‍රය වී ඇති අයුරු සම්මතකරණයට හසුව ඇති ආකාරයත්, සිදුව ඇති ප්‍රතිසංවර්ධනයන් හා නවීකරණයනුත් සාකච්ඡාවට ලක්විය. '**සිදත්සඟරාව නව ව්‍යාකරණ ග්‍රන්ථ හා භාෂා සැලසුම්කරණ ක්‍රම**' තත්ත්ව විග්‍රහයට පස්වන පරිච්ඡේදය වෙන්ව ඇත. එහි දී **සිදත්සඟරාව** පාදකව භාෂා ප්‍රතිවාදාත්මක මතවාද ගොඩනැගී ඇති අයුරුත්, **සිදත්සඟරාව** හේතු කොටගෙන ඒ ප්‍රතිමත ඇසුරෙන් හා විවිධ විග්‍රහයන් සහේතුකව කාලීන අවශ්‍යතා සඳහා නව ව්‍යාකරණ ග්‍රන්ථ සම්පාදනය වී ඇති අයුරුත් විමර්ශනය කෙරිණ. එහි දී ද **සිදත්සඟරා** ව්‍යාකරණ රීති දැක්වීම්වලට ලැබී ඇති සම්මතකරණයන් මෙන් ම නව නිර්දේශීකරණයන් විමසුමට ලක්වූ අතර ව්‍යාකරණ ග්‍රන්ථවල භාෂා සංහිතා සැලසුම්කරණයේ ස්වරූපය ද අධ්‍යයනයට හසු විය. අවසාන පරිච්ඡේදය වෙන්වූයේ **සිදත්සඟරා** කර්තෘගේ සිංහල භාෂාවේ ව්‍යාකරණ විෂය කොට සංහිතා සැලසුම්කරණ සිදුව ඇත්තේ ද යන්නත් එහි ස්වභාවය හා අධ්‍යයනයේ ප්‍රධාන නිගමන සමාලෝචනය කිරීම සඳහාත්ය.